**72, පාර්ක් වීදිය, කොළඹ-2, ශ්‍රී ලංකාව**
දු.ක: +94 11 231 4041/2/3/5 ෆැක්ස්: +94 11 231 4040
විද්‍යුත් තැපැල: info@ihp.lk වෙබ්: www.ihp.lk ට්විටර්: @ihplk

# PRESS RELEASE

**නිකුත් කිරීම**

දිනය: 2023 ජූලි 27
වේලාව: ශ්‍රී ලංකා වේලාවෙන් ප.ව. 1:00

**වැඩිදුර තොරතුරු සඳහා සම්බන්ධ කර ගැනීමට**

ඩැල්රීන් බාත්ලට්
විද්‍යුත් තැපැල: dalreen `at' ihp.lk


**ප්‍රධාන විමර්ශකයා සම්බන්ධ කර ගැනීමට**

ආචාර්ය රවී රන්නන්-එලිය
විද්‍යුත් තැපැල: ravi `at' ihp.lk ට්විටර්: @ravirannaneliya

# 2023 ජූනි මාසයේදී ජා.ජ.බ./ජ.වි.පෙ. සහ ස.ජ.බ. සඳහා වූ සහයෝගය පහත වැටී ඇති අතර, එමඟින් සියලු පිළිගත් පක්ෂ කෙරෙහි ජනතා කලකිරීම තවදුරටත් ඉස්මතු කර දක්වයි.


## *2023 ජූනි IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම*

2023 ජූනි මාසයේ පැවති නවතම ශ්‍රී ලංකා මත විමසුම් සමීක්ෂණයේදී (SLOTS), මැයි මසට සාපේක්ෂව ජා.ජ.බ./ජ.වි.පෙ. සඳහා අපේක්ෂිත ඡන්දදායකයින්ගේ සහයෝගය ලකුණු 5කින් ද ස.ජ.බ. සඳහා ලකුණු 4කින් ද පහත වැටී දෙපක්ෂයම 23% දක්වා ලඟා විය. එ.ජා.ප සඳහා අපේක්ෂිත සහයෝගයේ කිසිදු වෙනසක් සිදුව නොමැති නමුත් වෙනත් පක්ෂයන් සඳහා ඡන්දය ප්‍රකාශ කරන බව පවසන අපේක්ෂිත ඡන්ද දායකයින්ගේ ප්‍රතිශතය මැයි මාසයට සාපේක්ෂව ලකුණු 7 ක ඉහළ වර්ධනයක් සමඟ 28% දක්වා වැඩිවීමක් පෙන්නුම් කර ඇත.



පෙබරවාරි මස සිට මාස හතරක කාලය තුළ SLOTS මත විමසීමේදී, ප්‍රධාන පක්ෂ දෙකක් වන ජා.ජ.බ./ජ.වි.පෙ. සහ ස.ජ.බ. හි සහයේ සැලකිය යුතු අඩුවීමක් පෙන්නුම් කර ඇති අතර, වෙනත් සුළු හෝ නම් නොකළ පක්ෂවලට ඡන්දය ප්‍රකාශ කරන බව පවසන ඡන්දදායකයින්ගේ කොටස ලකුණු 17 කින් වැඩිව 28% ට ලඟා විය. එ.ජා.ප සහ ශ්‍රී.ල.පො.පෙ. විසින් සුළු ජයග්‍රහණයක් ලබා ඇති නමුත් දෙපාර්ශයම කරට කර සටනක යෙදෙමින් සම මට්ටමක පවතින අතර අපේක්ෂිත ඡන්දදායකයින් දස දෙනෙකුගෙන් එක් පුද්ගලයෙකුගේ සහය ඔවුන්ට ලැබෙන බව පෙන්වයි.

SLOTS මත විමසීමේ දී, "වෙනත්" කාණ්ඩය මඟින් පෙන්නුම් කරනු ලබන්නේ 2020 මහ මැතිවරණයට ඉදිරිපත් වූ අකිල ඉලංකෙයි තමිල් කොංග්‍රස් / දෙමළ ජාතික ජනතා පෙරමුණ (AITC) සහ අපේ ජන බල පක්ෂය (OPPP) වැනි කුඩා පක්ෂ සහ සමීක්ෂණයේදී නම් සඳහන් නොකරන ලද පක්ෂනට ඡන්දය ප්‍රකාශ කරනු ලැබූ ප්‍රතිචාර දක්වන්නන් වේ. බොහෝ අවස්ථාවලදී මෙම ප්‍රතිචාර දක්වන්නන් සමීක්ෂණයේදී නම් සඳහන් නොකළ වෙනත් පක්ෂයන් තෝරා ගන්නා බවත්, ඒවා තවදුරටත් හඳුනා ගැනීමට SLOTS මත විමසුම කටයුතු සිදු කරමින් සිටින බවත් SLOTS ප්‍රධාන අධ්‍යක්ෂ වෛද්‍ය රවී රන්නන්-එලිය මහතා අනාවරණය කළේය. 2021 අග භාගයේ SLOTS මත විමසීමේ දී "වෙනත්" කාණ්ඩයේ ආධිපත්‍යය දරනු ලැබුවේ ආණ්ඩු පක්ෂයට විරුද්ධත්වය ප්‍රකාශ කිරීමට බියවූ ප්‍රතිචාර දැක්වූවන් විසින් වන අතර, මෙම කාණ්ඩයේ මෑත කාලීන වර්ධනය තුළින් ආණ්ඩු පක්ෂයේ මෙන්ම විපක්ෂයේ සියලු පිළිගත් පක්ෂ කෙරෙහි පවතින කලකිරීමේ වර්ධනයක් පෙන්නුම් කරන වන බව ඔහු අදහස් කළේය.




**පෙර වාර්තාවන් ihp.lk වෙතින් ලබා ගත හැකිය**

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 පෙබරවාරි, "2023 ජනවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු. ජා.ජ.බ./ජ.වි.පෙ. සහ ස.ජ.බ. ඡන්දදායකයින් අතර කරට කර සටනක්.", SLOTS වාර්තාව #2023-03. https://ihp.lk/publications/docs/SLOTSReport202303.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මාර්තු, "2023 පෙබරවාරි IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු. ජා.ජ.බ./ජ.වි.පෙ., ස.ජ.බ. සහ දෙ.ජා.ස. වටා වැඩි ඡන්දදායකයින් ප්‍රමාණයක් ඒකරාශී වී ඇති අතරම එයින් ජා.ජ.බ./ජ.වි.පෙ. පැහැදිලි ලෙසම පෙරමුණ ගනී.", SLOTS වාර්තාව #2023-06. https://ihp.lk/publications/docs/SLOTSReport202306.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 අප්‍රේල්, “2023 මාර්තු IHP MRP ඡන්ද අභිප්‍රාය ඇස්තමේන්තු යාවත්කාලීන කිරීම: මාර්තු මාසයේ ඡන්ද මනාප වල සුළු වෙනසක්, ජා.ජ.බ./ජ.වි.පෙ. ස.ජ.බ. ට වඩා පැහැදිලි ලෙස ඉදිරියෙන් සිටියි, එ.ජා.ප.යේ නැගිටීමේ ලකුණක් පෙන්නුම් කරයි. 2023 මාර්තු IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම”, SLOTS වාර්තාව #2023-11.
https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230419.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 මැයි, “ජා.ජ.බ./ජ.වි.පෙ. තව දුරටත් ඉදිරියෙන් සිටින අතරම, ස.ජ.බ. සාපේක්ෂව සම මට්ටමේ පවතින අතරතුර එ.ජා.ප. සහ අනෙකුත් පක්ෂ සඳහා වන සහයෝගය අඩු වෙමින් පවතියි. 2023 අප්‍රේල් IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම”, SLOTS වාර්තාව #2023-15.
https://ihp.lk/news/pres_doc/IHPPressRelease20230525.pdf යෙන් ලබා ගත හැකිය.

සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය, 2023 ජූනි, “2023 මැයි මාසයේදී, 23% ක සහයක් ලැබූ NPP/JVP අභිබවා 26%ක් ලබා ගත් SJB ඉදිරියට පැමිණ ඇති අතර UNP සහ SLPP සඳහා වූ සහයෝගයේ ද වැඩි වීමක් පෙන්වයි. 2023 මැයි IHP MRP මහ මැතිවරණ ඡන්ද අභිප්‍රායන් යාවත්කාලීන කිරීම”, SLOTS වාර්තාව #2023-18.

https://ihp.lk/news/pres_doc/IHPPressRelease202306301.pdf යෙන් ලබා ගත හැකිය.

**සෞඛ්‍ය ප්‍රතිපත්ති ආයතනය (IHP) පිළිබඳව**

IHP යනු ශ්‍රී ලංකාවේ කොළඹ පිහිටි ස්වාධීන, පක්ෂග්‍රාහී නොවන පර්යේෂණ මධ්‍යස්ථානයකි. SLOTS හි ප්‍රධාන විමර්ශකයා වන්නේ IHP හි ආචාර්ය රවී රන්නන්-එලිය මහතා යි. ඔහු හාවඩ් විශ්ව විද්‍යාලයේ මහජන මත විමසුම් සමීක්ෂණ පිළිබඳ පුහුණුව ලබා ඇති අතර දශක තුනක් පුරා විවිධ මත විමසුම් සමීක්ෂණ සිදු කරමින් සිටියි.

**ක්‍රමවේදය**

අහඹු ජංගම දුරකථන අංක ඇමතීමෙන් සම්බන්ධ කරගත් වැඩිහිටියන්ගේ (වයස අවුරුදු 18 සහ ඊට වැඩි) නියැදියක් සහ මීට පෙර අහඹු තෝරා ගැනීමකින් බඳවා ගන්නා ලද ප්‍රතිචාර දැක්වූවන්ගේ නියැදියකට සිදු කරනු ලැබූ සම්මුඛ පරීක්ෂණ, SLOTS මඟින් ඒකාබද්ධ කරනු ලබයි. යම් මාසයක ප්‍රකාශිත ඡන්දය තක්සේරු කිරීම සඳහා සියලුම SLOTS සම්මුඛ සාකච්ඡාවල දත්ත යොදා ගනිමින් Multilevel Regression and Post-Stratification (MRP) ආකෘතියකට ගැලපීම තුළින් එම ආකෘතියේ අවිනිශ්චිතතාවයන් සැලකිල්ලට ගෙන බහුවිධ ඇස්තමේන්තු (multiple imputation) භාවිත කරමින්, IHP විසින් ඡන්දය ප්‍රකාශ කිරීමේ අභිප්‍රාය ඇස්තමේන්තු කරයි.

2023 ජූනි MRP ඇස්තමේන්තු, එම මාසය තුල පැවැත්වූ සම්මුඛ පරීක්ෂණ 506ක් සහ 2021 ඔක්තෝම්බර් 1 සිට 2023 ජූලි 20 දක්වා පැවැත්වූ මුළු සම්මුඛ පරීක්ෂණ 11,926ක් මත පදනම් වන අතර විවිධ පක්ෂ සඳහා 1-3%ක දෝෂ ආන්තිකයක් සමඟ ඇස්තමේන්තු කර ඇත. මීට පෙර සිදුකල යාවත්කාලීන කිරීමට වඩා ජූනි යාවත්කාලීන කිරීමේදී නවතම දත්ත කට්ටලය භාවිතා කරන බැවින්, පෙර මාස සඳහා ඡන්ද ඇස්තමේන්තු අගයන්හි සුළු වෙනස්කම් සිදු ව ඇත. ප්‍රතිචාර දක්වන ලද සම්මුඛ සාකච්ඡා වල නියැදියේ වෙනස්වීම් සහ ආකෘති නිර්මාණයේ අවිනිශ්චිතතාවයන් හේතුවෙන් ඇති වන ඇස්තමේන්තු ආශ්‍රිත අවිනිශ්චිතතාවය තක්සේරු කිරීම සඳහා ආකෘති නිර්මාණයේදී stochastic simulations 60ක් භාවිතා කරන ලදී.

MRP යනු විශ්ලේෂණයට කුඩා සාම්පල භාවිත කිරීම සඳහා වෙනත් රටවල ඡන්ද ආයතන විසින් සුලබව භාවිත කරනු ලබන ක්‍රමයකි, විශේෂයෙන් YouGov විසින් එක්සත් රාජධානියේ බ්‍රෙක්සිට් ජනමත විචාරණයේ සහ මෑත කාලීන එක්සත් රාජධානියේ මහ මැතිවරණයේ ප්‍රතිඵල පුරෝකථනය කිරීමට මෙම ක්‍රමය භාවිතා කළේය. වයස, ස්ත්‍රී පුරුෂ භාවය, ජනවාර්ගිකත්වය, සමාජ ආර්ථික තත්ත්වය, අධ්‍යාපනය, භූගෝලීය පිහිටීම සහ 2019

ජනාධිපතිවරණයේ සහ 2020 මහ මැතිවරණයේ ඡන්දය ප්‍රකාශ කිරීමට අනුව නියැදිය ජාතික ජනගහනයට ගැළපෙන බව සහතික කිරීමට සියලු ඇස්තමේන්තු නැවත සකස් කර ඇත.

**අරමුදල් සැපයීම**

නීලන් තිරුචෙල්වම් භාරය, එක්සත් රාජධානියේ සෞඛ්‍ය හා සත්කාර පර්යේෂණ සඳහා වන ජාතික ආයතනය (NIHR), ශ්‍රී ලංකාවේ ආසියා පදනම සහ අනෙකුත් අනුග්‍රාහකයින් විසින් SLOTS සඳහා අරමුදල් සපයයි. නමුත් අධ්‍යයන සැලසුම්, සහ සොයාගැනීම් විශ්ලේෂණය සහ අර්ථකථනය කිරීමේදී අනුග්‍රාහකයින් කිසිදු කාර්යභාරයක් ඉටු නොකරයි. වඩාත් සවිස්තරාත්මක දත්ත සහ ප්‍රතිඵල සඳහා උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට IHP සම්බන්ධ කර ගත හැකිය.